# අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

**10/11 ශ්‍රේණි සඳහා වීඩියෝ පාඩම් මාලාවට අදාළ ක්‍රියාකාරකම්**
**10 ශ්‍රේණිය - පරිච්ඡේදය 02 - ව්‍යාපාර පරිසරය**

**අභ්‍යන්තර පරිසරය**

..............................................................................................................................

**01. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක i හා ii ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

කෘෂිකර්මය පිළිබඳ උපාධියක් ලැබූ සම්පත් තමන් සතුව තිබූ මුදලක් ආයෝජනය කර කාබනික පොහොර යොදා එළවළු හා පලතුරු වගා කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. සම්පත්ගේ පියා පාරම්පරික ගොවි මහතෙකු වූ බැවින් කුඩා කල සිටම වගා කටයුතු පිළිබඳ ලද අත්දැකීම් හේතුවෙන් ඉතා කෙටි කාලයකින් ව්‍යාපාරික කටයුතු දියුණු කර ගැනීමට සම්පත්ට හැකි විය. ව්‍යාපාර කටයුතුවල දියුණුවත් සමග සේවකයන් දෙදෙනෙකු ද බඳවා ගත් අතර සේවකයන්ගේ කැපවීම හා යහපත් ආකල්ප හේතුවෙන් සම්පත්ගේ ව්‍යාපාරයට ප්‍රදේශයේ හොඳ නමක් දිනා ගැනීමට ද හැකි විය.

i. මෙම සිද්ධියෙහි සඳහන් අභ්‍යන්තර පරිසරයට අයත් වන පාර්ශ්ව 2ක් සඳහන් කරන්න.
ii. ඉහත ඔබ හඳුනා ගත් එක් එක් පාර්ශ්වයන්ගෙන් මෙම ව්‍යාපාරයේ සාර්ථකත්වයට හේතු වන කරුණු 2 බැගින් ලියන්න.

**02. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.**

(අ). ඇතැම් ව්‍යාපාරවල අයිතිකරුවෝ ම කළමනාකරුවෝ වෙති. ( )
(ආ). ව්‍යාපාරයක් සාර්ථක කර ගැනීමට නම් ව්‍යාපාර පරිසරය පිළිබඳ නිරන්තරයෙන් අවධානය යොමු කළ යුතු ය. ( )
(ඉ). ගනුදෙනුකරුවන් අභ්‍යන්තර පරිසරයට අයත් වන පාර්ශ්වයකි. ( )
(ඊ). ව්‍යාපාරයක ගනුදෙනුකරුවන් හා සේවකයන් අතර මනා සම්බන්ධතාවක් ගොඩනගන්නේ කළමනාකරුවන් ය. ( )

**03. දී ඇති වචන භාවිත කර පහත සඳහන් ප්‍රකාශවල හිස්තැන් පුරවන්න.**
(අයිතිකරුවෝ/අභ්‍යන්තර පරිසරය/සේවකයෝ/ව්‍යාපාර පරිසරය)

1. ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාමේදී ඊට බලපෑම් ඇති කරන විවිධ සාධක ක්‍රියාත්මක වන වටපිටාව ....................... යනුවෙන් හැඳින්වේ.
2. ව්‍යාපාර පරිසරය ප්‍රධාන වශයෙන් ....................... හා බාහිර පරිසරය යනුවෙන් වර්ග දෙකකට බෙදා වෙන් කළ හැකි ය.
3. ව්‍යාපාරයට අවශ්‍ය ප්‍රාග්ධනය යොදවන පුද්ගලයෝ....................... වෙති.
4. තම දක්ෂතා හා හැකියා ප්‍රයෝජනයට ගනිමින් පවරන ලද කාර්යයන් නිසි ආකාරයෙන් ඉටු කරන පුද්ගලයෝ ......................වෙති.

**04. නිවැරදි පිළිතුර තෝරන්න.**

1. සරණී හා රමණී "සණී ෆැෂන්" ව්‍යාපාරයේ අයිතිකරුවෝ වෙති. තරණී එහි සේවිකාවක ලෙස ඇඳුම් මැසීමේ කටයුතු සිදු කරයි. ධරණී ව්‍යාපාරයට අවශ්‍ය රෙදි තොග සැපයීම සිදු කරයි.

   ඉහත සඳහන් පාර්ශ්ව අතරින් "සණී ෆැෂන්" ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසරයට අයත් වන පාර්ශ්වයක් **නොවන්නේ,**

   (1). සරණී
   (2). රමණී
   (3). තරණී
   (4). ධරණී

2. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයට අයත් වන පාර්ශ්ව හා එම පාර්ශ්වයන්ගෙන් ව්‍යාපාරයට වන බලපෑම් කිහිපයක් පහත දැක්වේ.

| **අභ්‍යන්තර පරිසරයට අයත් වන පාර්ශ්ව** | **එම පාර්ශ්වයන්ගෙන් ව්‍යාපාරයට වන බලපෑම්** |
|---|---|
| 1. කළමනාකරුවෝ | A. මූල්‍ය ශක්තිය, ව්‍යාපාරික දැනුම හා පළපුරුද්ද |
| 2. සේවකයෝ | B. සම්පත් මෙහෙයවීම හා තීරණ ගැනීම |
| 3. අයිතිකරුවෝ | C. පවරන ලද කාර්යයන් නිසි ආකාරයෙන් ඉටු කිරීම |

   ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයට අයත් වන පාර්ශ්ව හා එම පාර්ශ්වයන්ගෙන් ව්‍යාපාරයට වන බලපෑම් නිවැරදි ව ගළපා ඇති පිළිතුර වන්නේ,

   (1). (1-B), (2-C), (3-A) ය.
   (2). (1-C), (2-B), (3-A) ය.
   (3). (1-A), (2-B), (3-C) ය.
   (4). (1-C), (2-A), (3-B) ය.

3. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයට අයත් වන පාර්ශ්ව හා එම පාර්ශ්වයන්ගෙන් ව්‍යාපාරයට වන බලපෑම් නිවැරදි ව දක්වා ඇති පිළිතුර වන්නේ,

   (1). කළමනාකරුවෝ - මූල්‍ය ශක්තිය වේ.
   (2). සේවකයෝ - තීරණ ගැනීම වේ.
   (3). කළමනාකරුවෝ - සම්පත් මෙහෙයවීම වේ.
   (4). සේවකයෝ - ප්‍රාග්ධනය යෙදවීම වේ.

4. ව්‍යාපාර පරිසරයේ සිදු වූ සිදුවීම් කිහිපයක් පහත දැක්වේ.

A. ව්‍යාපාරය පිළිබඳ යහපත් ආකල්ප පවතින හා සේවයට කැපවන සේවක පිරිසක් බඳවා ගැනීම.
B. රජය විසින් බැංකු පොලී අනුපාතිකය ඉහළ නැංවීම.
C. ව්‍යාපාරයේ කළමනාකරුවන් ව්‍යාපාරයේ සම්පත් මනා ලෙස කළමනාකරණය කිරීම නිසා ලාභ ලැබීම.

ඉහත සිදුවීම් අතරින් අභ්‍යන්තර පරිසරයට අයත් වන පාර්ශ්ව පමණක් ඇතුළත් වන පිළිතුර වන්නේ,

(1). A හා B ය.
(2). A හා C ය.
(3). B හා C ය.
(4). A, B හා C යන සියල්ලම ය.

**05.** ව්‍යාපාරයක සාර්ථකත්වය සඳහා ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසරයට අයත් වන පාර්ශ්වයන්ගෙන් ඇති වන බලපෑම් පිළිබඳ බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරන්න.